වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

2020



ජනමාධ්‍ය අමාත්‍යාංශය

வெகுசன ஊடக அமைச்சு

Ministry of Mass Media

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2020

ජනමාධ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය: 105

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව මෙම වාර්තාව සකස් කොට ඇත.

අන්තර්ගතය

පිටුව

පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1 - 17
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	19 - 32
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	33 - 48
පරිච්ඡේදය 04	-	කාර්ය සාධන දර්ශක	49 - 51
පරිච්ඡේදය 05	-	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	53 - 56
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ	57 - 62
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව	63 – 73

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම

ඈ) ව්‍යාපෘති කාල සීමාව

1.0 ජනමාධ්‍ය අමාත්‍යාංශය

1.1 හැඳින්වීම

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුගත වෙමින් මෙරට ජනමාධ්‍ය ක්ෂේත්‍රය නූතන ප්‍රවේශයන් කරා යොමුකරවීමේ කාර්යය මෙම අමාත්‍යාංශයට පැවරී ඇති බැවින් ජනමාධ්‍ය ක්ෂේත්‍රය ප්‍රාමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද සංවර්ධනය විය යුතු බව මෙම අමාත්‍යාංශය මැනවින් අවබෝධ කර ගෙන ඇත.

මෙම අමාත්‍යාංශය ජනමාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් ජාතික අවශ්‍යතාවය හඳුනා ගනිමින් ඊට නිසි ජවය හා උත්තේජනය සපයමින් "සෞභාග්‍යයේ දැක්ම" සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මූලික පියවර දැනටමත් ආරම්භ කර ඇත.

ශ්‍රී ලාංකේය අනන්‍යතාවය සුරකිමින් සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීමේ අභිලාෂයෙන් සමබර හා නිවැරදි තොරතුරු ලබා දීම සඳහා සියලුම මාධ්‍ය ආයතන සමග මිත්‍රශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමද එමගින් නව මාධ්‍ය සම්ප්‍රදායක් බිහිකිරීමට දායකවීමද මෙම අමාත්‍යාංශයේ පරමාර්ථයයි.

තොරතුරු තාක්ෂණයේ හා සන්නිවේදන මාධ්‍යයන්ගේ සීඝ්‍ර වර්ධනයත් සමග සමස්ථ මානව ප්‍රජාවම මාධ්‍යකරණයට ලක්ව ඇත. එබැවින් සමාජ සබඳතා නවීකරණය මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සබඳතා ශක්තිමත් කිරීමට, ජනමාධ්‍ය සතු ප්‍රබල ශක්‍යතා නිර්මාණශීලීව යොදා ගැනීමට අවශ්‍ය නියාමනයන් සහ උපදේශනයන් ලබා දෙමින් හොඳින් දැනුම්වත් වූ සමාජයක් බිහි කිරීම සඳහා මෙන්ම, ජනමාධ්‍ය අමාත්‍යාංශය, ස්වායත්ත හා වගකීම් සහිත ජනමාධ්‍ය කලාපයක් බිහි කිරීම සඳහා ද අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමේ කාර්යයේ නියුතුව සිටී.

දියුණු ජනමාධ්‍ය සදාචාරයක් සඳහා සමස්ත ජනමාධ්‍යවේදීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කර ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීමය තත්ත්වය උසස් කිරීමට හැකි මංපෙත් විවර කිරීම හා නවීන තාක්ෂණයේ පහස ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට යොදා ගැනීමට කටයුතු කිරීම මෙම අමාත්‍යාංශයේ වගකීමක් වන බැවින් "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කර ඇති පරිදි ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තිමයභාවය ඉහළ නැංවීම සඳහා ජනමාධ්‍ය අධ්‍යාපන පීඨයක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා පදනම් ආයතනය සමග මූලික පියවර ගෙන ඇත. නූතන ගෝලීය මාධ්‍ය අවකාශය තුළ මාධ්‍ය ප්‍රවණතාවලට අනුගත මාධ්‍ය වෘත්තිකයන් බිහිවීම යුගයේ අවශ්‍යතාවයකි.

ඕනෑම සමාජයක් නිසි පරිදි ක්‍රියාත්මක වීමටත් එම සමාජයේ ප්‍රතිසංස්කරණයන් හා නවීකරණයන් ප්‍රශස්ත මට්ටමකින් සිදු වීමටත් ජනමාධ්‍ය සිය මූලික කාර්ය භාරය වන ජනමතය නිසි ලෙස හැඩගැස්වීම කළ යුතුය. ආර්ථික වශයෙන් රටක් ගොඩනැගීමෙහිලා ක්‍රියාත්මක සංවර්ධන වැඩපිළිවෙළ සුබදායී දිශානතියකට යොමු කිරීමට ජනමාධ්‍ය සතු ප්‍රබල ශක්‍යතාවයන් නිසි පරිදි යොදා ගැනීම මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා මූලාරම්භයක් ලෙස "ඇසි දිසි පෙරමග" වැඩසටහන හඳුන්වාදී ඇත.

ජනමාධ්‍යවේදීන් සඳහාම හඳුන්වා දී ඇති ''ඇසි දිසි'' ශිෂ්‍යත්ව වැඩසටහන මගින් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා ද ඔවුන්ට අවශ්‍ය මාධ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා ද මූල්‍යාධාර සැපයීම අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

මුද්‍රිත මාධ්‍ය කෙරෙහි පමණක් අවධානය යොමු වූ පුවත්පත් මණ්ඩලය විද්‍යුත්, මුද්‍රිත සහ නව මාධ්‍ය ද ආවරණය වන පරිදි ව්‍යූහාත්මක ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූලික සාකච්ඡා ආරම්භ කර ඇත.

ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ද ඇතුළුව මාධ්‍යවේදීන්ට පහසුකම් සලසා දීම උදෙසා පුළුල් පහසුකම් සහිතව ජනමාධ්‍ය ස්ථාගාර (Press Clubs) ක්‍රමයක් පළාත්බදව පිහිටුවීමේ මූලාරම්භයක් ලෙස බස්නාහිර පළාතේ ප්‍රථම ජනමාධ්‍ය ස්ථාගාරය ස්ථාපිත කිරීමට සැළසුම් කර ඇති අතර ජනමාධ්‍යවේදීන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට අදාල පාර්ශව සමග සාකච්ඡා කර ඇත.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගනිමින් සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ දැනුම අවබෝධය හා සන්නිවේදන උපක්‍රම සමාජගත කරනු පිණිස අවශ්‍ය පියවර ගනු ලැබේ.

කොවිඩ් වසංගත තත්වය හමුවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 2020 වසර තුළදී තම අපේක්ෂිත ඉලක්කයන් සපුරාලීමට අසීරු විය. නමුත් 2021 වසරේදී එම ආයතන සමායන ලක්ෂයන්ට ලඟා වීමට දැනටමත් සැළසුම් සකස් කර ඇති අතර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව තම අලාභය අවම කර ගැනීමට අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් කෙටුම්පත් කර ඇත.

ශ්‍රී ලංකා ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ ව්‍යූහාත්මක වෙනස්කම් රැසක් සිදු කිරීමට රජය අපේක්ෂා කරන අතර පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක අවශ්‍යතාවය ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් පෙන්වා දී ඇත. සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය හැසිරවීම පිළිබඳ දැනුම, අවබෝධය හා සන්නිවේදන උපක්‍රම සමාජගත කිරීමට කටයුතු කිරීම ද ජනමාධ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී අවධානයට ගත යුතු බව හඳුනාගෙන ඇත.

මෙම අරමුණු ඉටුකර ගැනීමේ කර්තව්‍යයේදී දේශීයත්වය, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය හා සාරධර්ම ආරක්ෂා කර ගැනීමටත් ඒවා පෝෂණය කිරීමටත් සමස්ත ජනමාධ්‍ය ක්ෂේත්‍රයට මග පෙන්වීමටත් මෙම අමාත්‍යාංශය කටයුතු කරමින් පවතී.

2019.12.10 දින 2153/12 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය ලෙස ජනමාධ්‍ය අමාත්‍යාංශය නම් කෙරිණි. 2020 වසරේදී ද ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂයපථය වෙනස්කම් කිහිපයකට බඳුන් විය. 2020.01.13 දින 2158/06 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා ඇති විෂයයන් කිහිපයක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය වෙත පවරන ලදී.

2020.01.22 දින 2159/15 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අමාත්‍යාංශයේ නම තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය ලෙස නම් කෙරිණි.

2020.08.09 දින 2187/27 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, සැලසිනෙ රූපවාහිනී ආයතනය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සහ ලංකා පුවත් ආයතනය ලෙස ආයතන 11 ක් ජනමාධ්‍ය අමාත්‍යාංශයීය විෂයපථයට ද, තැපැල් හා ජනමාධ්‍යවේදී වෘත්තීය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය යටතට තැපැල් දෙපාර්තමේන්තුව ද පවරන ලදී. 2020.10.06 දින 2196/27 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව තැපැල් දෙපාර්තමේන්තුව ද ජනමාධ්‍ය අමාත්‍යාංශයීය විෂයපථය යටතට පවරන ලද බැවින් රේඛීය අමාත්‍යාංශය යටතට උක්ත ආයතන 12 ම පැවරිණි.

1.2 ආයතනික දැක්ම, මෙහෙවර, පරමාර්ථ

දැක්ම

“මනාව දැනුම්වත් වූ, බහුමතික සහ සක්‍රීය සමාජයක්”

මෙහෙවර

“ජනහිතකාමී වූ, සංවර්ධනයට දිශානත වූ, නිදහස් සහ වගකීම් සහිත ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම, පහසුකම් සැලසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම”

පරමාර්ථ

1. වඩා යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
2. මහජනතාවට තොරතුරු වෙත ප්‍රවේශවීමේ සමාන අවස්ථාවන් පුළුල් කිරීම.
3. නවීනතම තාක්ෂණය සමඟ මාධ්‍ය ක්ෂේත්‍රය වෙත පහසුකම් සැලසීම.
4. මාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම උදෙසා දිරිගැන්වීම.
5. ජාතික සංවර්ධන ප්‍රයත්නයේදී මාධ්‍ය දායකත්වය සහ සහභාගීත්වය ඉහල නැංවීම.
6. ජාත්‍යන්තර වශයෙන් රටෙහි ප්‍රතිරූපය ඔප්නැංවීම උදෙසා නායකත්වය සැපයීම.
7. අමාත්‍යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීම.
8. අමාත්‍යාංශය වෙත අනුබද්ධිත වූ ආයතනයන්හි සම්පත් සාර්ථකව ප්‍රයෝජනයට ගැනීම.
9. අදාල පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම තුලින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

(2019.12.10 දිනැති අංක 2153/12 දරණ ගැසට් නිවේදනය ප්‍රකාරවයි)

1. ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ජනමාධ්‍ය විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
2. ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි ප්‍රගමනකාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සම්පාදනය කිරීම.
3. ජනතාව තුළ දැනුම, ආකල්ප රසඥතාවයන් ඇති කරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. ජනතාවගේ නිවැරදි තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
5. උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2020.08.09 දිනැති අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව විෂයපථය, කාර්යයන් හා කර්තව්‍යයන් හා අමාත්‍යාංශයේ සුවිශේෂී ප්‍රමුඛතා

විෂයපථය

භාෂාවේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීමය කුසලතා සංවර්ධනයට කටයුතු කිරීම


කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "විනිවිදභාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක්" හඳුන්වාදීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදුකිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, තැපැල් සේවාව ජනතා කේන්ද්‍රීය අවශ්‍යතාවයන් ඉලක්ක කරගත් සේවාවක් බවට පුළුල් කිරීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

සුවිශේෂී ප්‍රමුඛතා

- විනිවිදභාවයෙන් යුත් ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.
- ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීම සඳහා පළාත් මට්ටමෙන් කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා තැපැල් සේවය ජනතා අවශ්‍යතා සඳහා පුළුල් කිරීම.

1.4 සංවිධාන සටහන - 2020



අනෙකුත් තනතුරු :	අනුමත		අනුමත
ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහකාර, සංවර්ධන නිලධාරී	44	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික (ICT) නිලධාරී	01
විමර්ශන නිලධාරී (ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය)	11	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික (ICT) සහකාර	05
රාජ්‍ය කලමනාකරණ සහකාර	27	සහකාර තාක්ෂණික නිලධාරී	01
පිළිගැනීමේ නිලධාරී	01	රියදුරු	18
		කාර්යාල සහායක	20

අනුමත සේවක සංඛ්‍යාව - 158

තත්‍ය සේවක සංඛ්‍යාව - 107

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව – 2020.09.04, 2020.09.18 සහ 2020.11.27 දිනැති ලිපි ප්‍රකාර

1.5 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

අමාත්‍යාංශයීය විෂයපථය යටතේ දෙපාර්තමේන්තු 03 ක් ඇත.

1.5.1 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 1948 ජූනි මස 31 දින ආරම්භ කරන ලදී. රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මගින් ඉටුකරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන අතර ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිවයුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීමද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

1.5.2 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

වර්ෂ 1802 දී "ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය" ලෙසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ රජයේ මුද්‍රණාලය ලෙස මෙම දෙපාර්තමේන්තුවේ ලිඛිත ආරම්භය සනිටුහන් වේ. පසුකාලීනව රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙස විකාශය වූ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මේ වන විට "රජයේ නිල මුද්‍රණකරුවා" ලෙස පුරෝගාමී මෙහෙවරක යෙදී සිටී. විශේෂයෙන්ම අවම සම්පත් ප්‍රමාණයක් භාවිතා කරමින් ආරම්භ වූ මෙම දෙපාර්තමේන්තුව මේ වන විට නූතන අධිතාක්ෂණික ක්‍රමවේද සමග අනුගත වෙමින් ඉතා විශිෂ්ඨ සේවාවක් රජය වෙනුවෙන් සපයනු ලබන බව ඉතා පැහැදිළි කරුණකි. කර්මාන්තශාලාමය ස්වභාවයක් ගත් නිෂ්පාදන ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුව මගින් සියලුම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල හදිසි, වැදගත් මෙන්ම රහස්‍ය මුද්‍රණ කටයුතු ඉතා උසස් නිමාවකින් යුක්තව කලට වේලාවට ඉටු කර දීම තුළින් අදාළ ආයතනයන්හි විශ්වාසය තහවුරු කර ඇත.

නවීන මුද්‍රණ ක්‍රමවේද උපයෝගී කර ගනිමින් ඉහළ ගුණාත්මකභාවයකින් යුතු මුද්‍රණ නිමැවුම් ඉදිරිපත් කරමින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව නොනිමි මෙහෙවරක් ඉටු කරනු ලබයි. එමෙන්ම, ආරක්ෂිත මුද්‍රණ ක්‍රමවේදයන් වැඩිදියුණු කර ශ්‍රී ලංකා රජයේ සියලුම රහස්‍ය මුද්‍රණ අවශ්‍යතා සපුරාලීම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

1.5.3 ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සන්නිවේදන සේවා සැපයීමේ ප්‍රමුඛතමයා වශයෙන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අත්‍යවශ්‍ය සේවා සපයන රාජ්‍ය ආයතනයකි. ස්වෛරීභාවයේ සිට පෞද්ගලීකරණය සහ තරගකාරීත්වය ඇතිවීම දක්වා තැපැල් දෙපාර්තමේන්තුවට තම උන්නතිය උදෙසා බොහෝ අභියෝගයන්ට, ප්‍රධාන වශයෙන් තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ සිඝ්‍ර දියුණුවට මුහුණදීමට සිදුවී ඇත. නමුත් අන්තර්ජාල ව්‍යාපාරික කටයුතු හා බද්ධ වී සේවා සැපයීම (E-commerce), මූල්‍ය සේවා (Financial Inclusion) හා සැපයුම් සේවා (Logistics Services) අංශයන් කෙරෙහි ඇති ව්‍යාපාරික නැමියාවේ කැපීපෙනෙන වර්ධනය හමුවේ දෙපාර්තමේන්තුවට ලැබී ඇති අවස්ථාවන් අතිමහත් වේ.

ඒ අනුව ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර හා දේශීය තැපෑල සම්බන්ධයෙන් වන නව ප්‍රවණතාවයන්ට අනුගතව, නවීන තාක්ෂණය හා අලෙවිකරණ සංකල්ප යොදාගනිමින් වෙනස් වන පාරිභෝගික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කාර්යක්ෂම හා ගුණාත්මක සේවා ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටී.

තැපැල් දෙපාර්තමේන්තුව යනු හුදෙක් ලාභ ලැබීමේ අරමුණින් පමණක් පවත්වාගෙන යනු ලබන ආයතනයක් නොව සමාජ සේවා ක්‍රියාත්මක කිරීමේ රජයේ නියෝජිතයා ලෙස ඉතා වැදගත් කාර්යභාරයක් සමාජය උදෙසා ඉටුකරනු ලබන රාජ්‍ය ආයතනයක් බව මනාව තහවුරු වේ.

1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
ii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
iii) සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
iv) සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
v) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
vi) සැලසිනෙ රූපවාහිනී ආයතනය
vii) ලංකා පුවත් ආයතනය
viii) ශ්‍රී ලංකා පදනම් ආයතනය
ix) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

1.6.1 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

1949 ඔක්තෝබර් 01 වැනි දින ගුවන් විදුලි දෙපාර්තමේන්තුව නැමැති ස්වාධීන ආයතනයක් වශයෙන් ප්‍රතිස්ථාපනය කරන ලද මෙම ආයතනය 1972 මැයි 22 ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමග ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ලෙස නාමය වෙනස් කරන ලදී. අනතුරුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ගුවන් විදුලි සන්නිවේදනයේ ප්‍රමුඛතම පුරෝගාමී මාධ්‍ය ජාලය ලෙස ශ්‍රාවකයන් කේන්ද්‍රගත කරමින් ඒ ඒ සමාජ අවශ්‍යතා හඳුනාගනිමින් "පහසුකම් සපයන්නෙකු" ලෙස ජනතාවගේ විවිධ අවශ්‍යතා ඉටු කරන විද්‍යුත් මාධ්‍ය ජාලය බවට පත්ව ඇත. දිගු තරංග, මධ්‍යම තරංග, කෙටි තරංග සහ FM තරංග මාලා ඔස්සේ දේශීය විකාශන ජාලය තුළ ජාතික නාලිකා 06 කින්, ප්‍රාදේශීය සේවා 07 කින් සහ ප්‍රජා ගුවන් විදුලි සේවාවකින් සමන්විතව විකාශන කටයුතු සිදු කරනු ලබන අතර ගුවන් විදුලි සංස්ථාව සතු ප්‍රධාන විකාශන මධ්‍යස්ථාන 09 මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි විකාශන කටයුතු සිදුවේ. මීට අමතරව පුත්තලම හා ත්‍රිකුණාමලය යන ප්‍රතිවිකාශන මධ්‍යස්ථාන මගින් විදේශීය විකාශන කටයුතු සිදුකරනු ලබයි. විශ්වාසනීය හා අවංක මාධ්‍ය මෙහෙවරකින් යුතු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ශ්‍රාවකයාට වඩාත් සමීපවීම පිණිස තම වෙබ් අඩවිය ඔස්සේ ජාත්‍යන්තරය යා කිරීමේ මාර්ගයට ද ප්‍රවේශ වී ඇත. 1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ සංස්ථාවෙහි කාර්යභාරය ලැයිස්තු ගත කොට තිබේ.

1.6.2 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත මගින් ස්ථාපිත කරනු ලැබීය. මෙරට රූපවාහිනී ප්‍රචාරක සේවයක් පවත්වාගෙන යාමේ කාර්යය සහ එම සේවය සංවර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම හා දියුණු කිරීම ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කරුණු සඳහා ද අදාළ පනතෙන් විධිවිධාන සලසා ඇත. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර වැඩසටහන් නිෂ්පාදනය කිරීම හා විකාශනය කිරීම සිදුවේ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව "රූපවාහිනී", "අයි" සහ "නේත්‍රා" වශයෙන් නාලිකා තුනක් ඔස්සේ රූපවාහිනී වැඩසටහන් ක්‍රියාත්මක කරයි. සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින රූපවාහිනී තාක්ෂණයට අනුගත වෙමින් ප්‍රේක්ෂකයින් වෙත උසස් තත්වයේ නිර්මාණයන් ළඟා කර දීම සඳහා ජාතික නාලිකාව වශයෙන් ජාතික වගකීමක් ඉටුකරනු ලැබේ. දශක තුනක කාලයක් තුළ දෙස් විදෙස් සම්මානයට පාත්‍ර වූ උසස් තත්වයේ වැඩසටහන් නිපදවමින් හා ප්‍රවෘත්ති සැපයීමෙන් ප්‍රේක්ෂකයින්ගේ රසඥතාව හා දැනුම ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හැකිව තිබේ. රටේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනතා දැනුම්වත්භාවය ඉහල නංවමින් ජාතික මාධ්‍ය ආයතනයක් ලෙස සිය මෙහෙවර සාර්ථකව ඉටුකොට තිබේ.

1.6.3 සී /ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

1979 දී සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මාධ්‍ය ජාලයක් වශයෙන් කටයුතු කරමින් සිටී. සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ITN) රජය සතුවූ පොදු සමාගමක් ලෙස පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් වෙනුවෙන් ස්වාධීන රූපවාහිනීය ITN හා වසන්තම් TV ලෙස රූපවාහිනී නාලිකා දෙකක් ද ITN FM හා වසන්තම් FM ලෙස ගුවන් විදුලි සේවා දෙකක් ද පවත්වා ගෙනයනු ලැබේ. මෑත කාලීනව ඉතාමත් ප්‍රබල රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍ය ජාලය බවට ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය වර්ධනය වූ අතර, මුළු මහත් ශ්‍රී ලංකාව පුළුල්ව ආවරණය කෙරෙන ඉතා ප්‍රබල විකාශන ශක්තියක් සතු වේ. මුල් අවධියේ සිටම උසස් ප්‍රමිතියකින් යුතු වැඩසටහන් සිය ප්‍රේක්ෂක පිරිස වෙනුවෙන් පෙළගස්වන්නට ස්වාධීන රූපවාහිනිය සමත් වූ අතර ශ්‍රී ලාංකේය සංස්කෘතික, සමාජයීය හා ආගමික සාරධර්ම අනුගමනය කරමින් පවුලේ නාලිකාව ලෙස නමක්, ගරුත්වයක් හා ඉහළ පිළිගැනීමක් ද අත් කරගෙන ඇත.

1.6.4 සී /ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

"ලේක්හවුස්" නමින් ප්‍රචලිත සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 1926 දී ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද රජය සතු සීමිත සමාගමකි. 1973 අංක 28 දරණ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (විශේෂ විධිවිධාන) පනත අනුව එහි 88% ක හිමිකාරීත්වය රජය වෙනුවෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් දරයි. වර්තමානය වනවිට රටේ ප්‍රධානතම පුවත්පත් මුද්‍රණ ආයතනය ලෙස සිය ස්ථානය රැකගෙන සිටී.

අන්තර්ජාලය ජංගම දුරකථන තුළට පිවිසීමත් සමග දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් පුවත්පත්වල ජංගම මෘදුකාංගයන් එළිදැක්වීමට ද කටයුතු කර ඇති අතර අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ජාල තුළ ලේක්හවුස් වෙබ් පිටුව පරිහරණය කරන්නන්ට වැඩි විනෝදාස්වාදයක් ලබාදෙන අයුරින් පුවත් විකාශය කිරීම සඳහා නව ශබ්දාගාරයක් ද හඳුන්වාදී ඇත. ශත වර්ෂයකට ආසන්න සිය ගමන් මග තුළ මාධ්‍ය කර්මාන්තයේ පෙරලිකරු ලෙස තම ස්ථානය තහවුරුකර ගැනීමට ලේක්හවුස් ආයතනය සමත්ව ඇත. ජාතික ආයතනයක් වශයෙන් මාධ්‍ය කර්මාන්තයේ මෙන්ම ජාතියේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම හා එම අරමුණු මත පදනම්ව ආයතනයේ අඛණ්ඩ වර්ධනයක් ලභාකර ගැනීම ලෙක්හවුස් ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයයි.

1.6.5 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මෙම අමාත්‍යාංශය යටතේ කටයුතු කරන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. පුවත්පත් නිදහස ආරක්ෂා කරගැනීම මෙම මණ්ඩලයේ ප්‍රමුඛ අරමුණ වන අතර, එම නිදහස අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීම, පුවත්පත්වල අන්තර්ගතයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම, මහජනයා සතු සත්‍ය කරුණු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම යන අරමුණුද අවශේෂ අනෙකුත් අරමුණු අතර වැදගත් වේ. පුවත්පත් වාර්තාවල පළවන ඇතැම් විවාදාත්මක කරුණු සම්බන්ධයෙන් ආචාරධර්මානුකූලව මාධ්‍යවේදීන් හැඩගන්වමින් යම් නෛතික ප්‍රවේශ ඔස්සේ මාධ්‍යවේදීන් සඳහා මහපෙන්වීමේ කටයුතු මෙන්ම, මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඔවුන්ගේ වෘත්තීමය තත්වය ඉහළ දැමීමටත් විශේෂ අවධානයක් යොමු කර ඇත.

පුවත්පත් විධිමත් කිරීම, පුවත්පත් නිෂ්පාදනයෙහි හෝ පළකිරීමෙහි නියුක්ත සියලු අංශ අතර ක්‍රියාකිරීමේ නිසි සම්බන්ධතාවයකට අනුබල දීම, පුවත්පත් භාවිතය හා පුවත්පත්වල අවශ්‍යතා පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, පත්‍ර කලාවේදී වෘත්තියට බඳවා ගැනීමේ ක්‍රම, සුබසාධනය අධ්‍යාපනය හා පුහුණු කිරීම් වැඩිදියුණු කිරීම හා පුවත්පත් පවත්වාගෙන යාමට අදාළ කවර කරුණක් සම්බන්ධයෙන් වුවද කටයුතු කිරීම පුවත්පත් මණ්ඩලය සතු කාර්යභාරය වේ.

1.6.6 සැලසිනේ රූපවාහිනී ආයතනය

එවකට සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අනුබද්ධිතව 1982 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද සැලසිනේ රූපවාහිනී ආයතනය, 1997.06.09 දිනැති 979/2 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිට මේ දක්වා වරින් වර ජනමාධ්‍ය විෂය පථය අයත් අමාත්‍යාංශ යටතට ගැසට් කෙරුණි. මෙම ආයතනය මූලිකවම රාජ්‍ය දැන්වීම් පළ කරන ආයතනයක් මෙන්ම ඉසව් කළමනාකරණ ආයතනයක් ලෙසද ක්‍රියාත්මක වන ලදී. ස්වාධීන නෛතික ආයතනයක් ලෙස ස්ථාපිතවී නොමැති නමුදු, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්ට 100% ක හිමිකාරීත්වය සහිතව මෙම ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ව්‍යවස්ථාපිත වීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත.

1.6.7 ලංකාපුවත් ආයතනය

ලංකාපුවත් ආයතනය ජාත්‍යන්තර පුවත් ඒජන්ත ආයතනවලට සමගාමීව 1978 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති නෛතික පුද්ගලභාවයක් ඇති ආයතනයකි. මෙම ආයතනය ලංකාවේ විදේශීය පුවත් ඒජන්සිය (Foreign News Agency) ලෙස විදේශීය රටවල පුවත් ඒජන්තවරුන් සමඟ කටයුතු කළ ද පසුගිය සිව්වසර පුරාවට මෙම ක්‍රියාවලිය අඩපණ වී ඇත. වර්තමානයේ ලංකා පුවත් ආයතනය බොහෝදුරට අක්‍රීය තත්ත්වයේ පවතින අතර මොබිටෙල් ආයතනය සමඟ ගිවිසුමකට එළඹ ඇති පරිදි කෙටි පණිවිඩ සේවාවක් (SMS Alert) පවත්වාගෙන යමින් ආයතනයේ වෙබ් අඩවියේද ප්‍රවෘත්ති යාවත්කාලීන කරනු ලැබේ. මෙම ආයතනය ආදායම් උපදවන ව්‍යාපාරික ඒකකයක් ලෙස "ලංකාපුවත්" යන නාමය ජාත්‍යන්තරය හඳුනාගැනීම සඳහා පුළුල් කිරීමට යෝජනා වී ඇත.

1.6.8 ශ්‍රී ලංකා පදනම් ආයතනය

ශ්‍රී ලංකා පදනමේ ව්‍යාපෘතියක් වන ශ්‍රී ලංකා පදනම් ආයතනය වූ කලී සමාජ ඒකාබද්ධතාවය සහ සමාජ ප්‍රගමනය යන විශේෂිත ශික්ෂණයන් මාලාවක් කේන්ද්‍රගත කරගනිමින් සේවය සලසන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ වැඩිහිටි අධ්‍යාපන ආයතනයකි. 1973 වසරේ අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් නීතිය යටතේ පිහිටනු ලැබීමෙන් අනතුරුව මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, සාමය සහ ප්‍රතිසන්ධානය යන ශික්ෂණයන් අනුක්‍රමිකව සහ මනාව අනුගත කර ගැනීමේ හේතුවෙන් ප්‍රකාශයට පත් ව ඇති ඉන් පිළිබිඹු කෙරෙන්නේ අද්විතීය ආකාරයේ ආදර්ශයකි.

ශ්‍රී ලංකා පදනම් ආයතනය සිය අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් මගින් රටෙහි බලපාන අධ්‍යයතන සමාජ, දේශපාලන, ආර්ථික හා ආර්ථික සන්ධර්භයන්හි ගැටළු වලට පිළියම් සැලසීමට උපකාරී වෙමින් ජාතික කේන්ද්‍රීය ස්ථානයක් වශයෙන් දේශයට මෙහෙවරක් ඉටුකරමින් සිටී. සිවිල් අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍යය කෙරෙහි සිය විශේෂ අවධානය යොමුකරන අතරම ශ්‍රී ලංකා පදනමේ ප්‍රධාන අරමුණ වන්නේ ගෝලීය හා ජාතික වැදගත්කමකින් යුතු විවිධ අධ්‍යාපනික අවශ්‍යතා කෙරෙහි සිය එල්ලය යොමු කිරීමය.

1.6.9 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 11 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පොදු අධිකාරීන් සුපරීක්ෂණය කිරීමෙහි සහ තොරතුරු නීතිය බලාත්මක කිරීමේ ආයතනය වශයෙන් ස්ථාපිත කරන ලදී. ව්‍යවස්ථාපිතව ස්වාධීන ආයතනයක් වන අතර තොරතුරු පනතේ විධිවිධාන වලට අනුකූල නොවීම පිළිබඳ පැමිණිලි විභාග කිරීමේ හිමිකම ඇති අතර එහි විධිවිධාන උල්ලංඝනය කරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමෙහිලා නිර්දේශ ඉදිරිපත් කිරීමේ හැකියාව ද සහිතය. තවද පනත මගින් නිර්මිත වැරදි සිදුකරන්නවුන්ට එදිරිව නඩු පැවරීමේ බලය එයට පවතී.

පනත යටතේ පොදු අධිකාරීන් මගින් සිය රාජකාරිවලට අනුගතව කටයුතු කරන්නේදැයි ඇගයීමේ කාර්ය කොමිෂන් සභාව සතු වන අතර යම් පොදු අධිකාරියක් සඳහා අවශ්‍ය කරන්නා වූ සාමාන්‍ය

ප්‍රතිසංස්කරණ මෙන්ම විශේෂිත වූ ප්‍රතිසංස්කරණද සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් තොරතුරු නිදහස් කිරීම සඳහා රාජ්‍ය ආයතන වෙත සාධාරණ ගාස්තු තීරණය කිරීම සම්බන්ධ උපදෙස් නිකුත් කිරීමටත්, නොමිලයේ තොරතුරු නිදහස් කල යුතු අවස්ථා නිර්දේශ කිරීමටත්, ගාස්තු උපලේඛනය නිර්දේශ කිරීමටත්, රජයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය / හැසිරවීමටත්, පනත යටතේ හිමිකම් සහ අවශ්‍යතා ප්‍රසිද්ධ කිරීමටත් එමෙන්ම රජයේ ආයතන විසින් නිසි පරිදි වාර්තා තබා ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ උපදෙස් මාලා නිකුත් කිරීමටත් කොමිෂන් සභාව බැඳී සිටී.

මෙම පනත යටතේ අභියාචනා විභාග කිරීම සඳහා කොමිෂන් සභාවට බලය ලැබී ඇත. මෙයට යම් පුද්ගලයකු දිවුරුමකින්/ ප්‍රතිඥාවක් මත පරීක්ෂාවට ලක් කිරීමටත් ඔහුගේ/ ඇයගේ සන්තකයෙහි පවත්නා ඕනෑම තොරතුරක් ඉදිරිපත් කිරීම එකී පුද්ගලයාගෙන් සිදුකරවීමට බලය පවතී. (විශේෂිත කරන ලද තොරතුරු පරීක්ෂණයට බඳුන් කිරීම රහස්‍යව සිදු කරනු ලැබේ). පනතින් විශේෂිත කරන ලදුව ආවරණය කරන ලද තොරතුරු ද ඇතුළු ඕනෑම රාජ්‍ය ආයතනයක පවත්නා තොරතුරක් පරීක්ෂා කිරීමේ හිමිකම කොමිෂන් සභාව සතුය. යම් ආකාරයකින් තොරතුරු සැපයීම සඳහා යම් රජයේ ආයතනයකට උපදෙස් දීමට කොමිෂන් සභාවට හැකියාව ඇති අතර මහජනතාවට ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටී තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට (විශේෂිත වූ කරුණු හැර) යම් රාජ්‍ය ආයතනයක් යොමුකිරීමේ හැකියාව සහිතය. යම් තොරතුරක් ලබාදීම ප්‍රමාද කිරීම කරණ කොට ගනිමින් යම් පුරවැසියකුගෙන් අයකරන ලද යම් මුදලක් නැවත ලබාදීම සඳහා යම් රාජ්‍ය ආයතනයක් යොමු කිරීමට ද කොමිෂන් සභාවට හැකියාව පවතී (15 වන වගන්තිය).

1.7 විදේශ මූල්‍යනය මත දිවෙන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

1.7.1 අ) ව්‍යාපෘතියෙහි නම : ගැටුම්වලින් බලපෑමට ලක්වූ සහ ආන්තික ප්‍රජාවන්ට තොරතුරු දැනගැනීමේ සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ආ) ආධාර ලබා දෙන ආයතනය : ස්විස්ටර්ලන්ත රජය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : රුපියල් මිලියන 4.5

ඈ) ව්‍යාපෘති කාලය : 2018 මැයි – 2020

1.7.2 අ) ව්‍යාපෘතියෙහි නම : ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙහි රූපවාහිනී වැඩසටහන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ආ) ආධාර ලබා දෙන ආයතනය : ජපාන රජය (JICA)

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : රුපියල් මිලියන 101.6

ඈ) ව්‍යාපෘති කාලය : 2017 – 2022

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ජයග්‍රහණ

2.1.1 "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ජනමාධ්‍ය ප්‍රතිපත්තියෙහි සඳහන් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

i) *ඇසි දිසි පෙරමග - සෞභාග්‍යයේ පුනරුදය*

නව රජයේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව රජයේ අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින ආයතන විසින් රටේ සංවර්ධනයටත්, ජනතා සුබ සාධනයන් වෙනුවෙන් ඉටුකරනු ලබන හා ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා "ඇසිදිසි පෙරමග" සෞභාග්‍යයේ පුනරුදය නමින් ප්‍රචාරක වැඩසටහනක් ගරු ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාගේ උපදෙස් පරිදි ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් මේ වනවිට ආරම්භ කර ඇත. මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශයීය විෂය යටතේ පවතින රජයේ ප්‍රධාන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ද ක්‍රියාකාරීව දායකවේ. මීට අමතරව පෞද්ගලික මාධ්‍ය ආයතන ද මේ සඳහා සම්බන්ධකර ගැනීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ අරමුණු

- රජය විසින් ඉටු කරනු ලබන, ඉටු කිරීමට අපේක්ෂිත සංවර්ධන කාර්යයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
- සංවර්ධන පුවත් සඳහා මාධ්‍ය තුළ සැලකිය යුතු ඉඩ ප්‍රමාණයක් ලබාගැනීම.
- සංවර්ධන පුවත් ජනගත කිරීම පිළිබඳව මාධ්‍යවේදීන් හා මාධ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.
- මාධ්‍ය මගින් දැනුවත් කිරීම තුළින් සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රතිලාභීන් ස්ථිරවම එම ක්‍රියාවලිය තුළට දායක කරගැනීම.

වත්මන් ජනමාධ්‍ය භාවිතය තුළ විවිධ අවස්ථාවන් වලදී ජනසමාජයේ ප්‍රගමනයට බාධා වන අයුරින් ජනතාව වෙත තොරතරු මුදාහැරීම සිදුකරන බැවින් එම තත්ත්වය මගහැරවීම සඳහා නිවැරදි සංවර්ධන තොරතුරු ජනතාව වෙත ලබා දීමත් ඒ සඳහා මුලු රාජ්‍ය යාන්ත්‍රණයේම සහාය ලබාගැනීමත් මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ.

ii) *පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් කිසියම් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පවතින නිරෝගී ලක්ෂණයක් නම් අන්තර්ජාතික සම්මුතීන් විසින් පිළිගන්නා භාෂණයේ හා ප්‍රකාශනයේ ඇති නිදහසය. ජනතාවට නිවැරදි දේශපාලන ආර්ථික සහ සමාජීය තීරණ ගැනීමට හැකිවන්නේ ඔවුන් නිවැරදි තොරතුරුවලින් හා දැනුමෙන් සන්නද්ධ වූ විටය. ඒ සඳහා බාධා විරහිත ව තොරතුරු, දැනුම හා මතවාද සන්නිවේදනයට අවකාශ තිබිය යුතුය.*

ඒ අනුව අමාත්‍යාංශය විසින් තව දුරටත් තොරතුරු දැනගැනීමේ පනත අනුව කටයුතු කරයි. තවද නිවැරදි තොරතුරු මහජනතාව වෙත රැගෙන යාම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සන්නද්ධ කිරීමට කටයුතු කරන ලද අතර සියළු ජන කොටස් සඳහා නිවැරදි තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි රාජ්‍ය මාධ්‍ය ආයතනයන්හි ආවරණ කලාප පුළුල් කිරීමට කටයුතු කරන ලදී.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අගෝස්තු මස 04 වන දින සිට බලාත්මක වූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීම සම්බන්ධයෙන් වන වගකීම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. 2017 පෙබරවාරි මස 03 වන දින සිට මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර රජයේ නිල තොරතුරු ජනතාවට දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලන මූලධර්ම මනාව ක්‍රියාවට නැංවීමත් එමගින් දූෂණයෙන් තොර යහපත් වගකීම් සහිත රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි මූලික පරමාර්ථය විය. මෙම පනත සමාජගත කිරීම උදෙසා 2017 වසරේ සිටම ජනමාධ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව සක්‍රීය ලෙස දායක විය.

2020 වර්ෂයේදී තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මනා අවබෝධයක් පුරවැසියන් වෙත ලබාදීමේ අරමුණින් "ගමට තොරතුරු අයිතිය" RTI ජංගම සේවා පවත්වා ඇත. මෙම වැඩසටහන් සඳහා සිවිල් සංවිධාන සාමාජිකයින් මෙන්ම සිවිල් පුරවැසියන්ද සහභාගී විය. මෙම වැඩසටහන් තුලින් අදාල පළාත්වාසී ජනතාව තොරතුරු දැනගැනීමේ අයිතිය සහ එහි වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම හා ඔවුන්ට පවතින ගැටළු සහගත තත්ත්වයන් සම්බන්ධව එම අවස්ථාවේදීම විද්වත් මඩුල්ලක් මගින් විසඳුම් ලබාදීම ද සිදු කරන ලදී. වවුනියාව, කිලිනොච්චිය, නුවරඑළිය, මාතලේ, මොණරාගල සහ බණ්ඩාරවෙල යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පුද්ගලයින් 2600 ක් සහභාගි වී ඇත. මීට අමතරව මහජනතාව දැනුවත් කිරීම සඳහා තොරතුරු අයිතිවාසිකම් ඒකකය විසින් 2020 මාර්තු 11 සිට 14 දක්වා හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ පවත්වන ලද InnoTech-2020 තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධව වාර්ෂික වාර්තා, කොමිෂන් සභාව වෙත යොමු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම යටතේ තොරතුරු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 02 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය අනුග්‍රහයෙන් කුරුණෑගලදී සහ මහනුවරදී පවත්වන ලද අතර මෙම වැඩසටහන් 02 සඳහා තොරතුරු නිලධාරීන් 500 ක් පමණ සහභාගී විය.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටපත් බෙදාහැරීම සිදු කර ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය පරිසර යුක්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව සහ ශික්ෂණ රෝහල - රාගම යන ආයතනයන්හි පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් සම්බන්ධ කිරීම සහ සම්පත් කට්ටල බෙදා හැරීම සිදු කර ඇත.

මාර්ගගත (online) ක්‍රමවේදයට යොමුවීම යටතේ මාර්ගගත තොරතුරු ලබාගැනීම සඳහා වෙබ් අඩවි සකස් කිරීමේදී විද්‍යුත් ලිපිගොනු කළමනාකරණ පද්ධති නිර්මාණය කිරීම තුලින් තොරතුරු අයිතිවාසිකම් පනත සම්බන්ධ නිසි යාන්ත්‍රණයක් පවත්වා ගැනීම සහ රාජ්‍ය ආයතන කාර්යක්ෂම කිරීමද මෙම මාර්ගගත ක්‍රමවේදයෙන් අපේක්ෂා කෙරේ.

තොරතුරු පනතට අදාල තොරතුරු ලබාගැනීමේ ඉල්ලුම්පත් විද්‍යුත් මාර්ගයෙන් ලබාගැනීම (RTI Online Tracking System) හඳුන්වාදීම සඳහා ප්‍රගාමී තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් සහ අමාත්‍යාංශයීය විෂය පථය යටතේ පවතින ආයතනවල නිලධාරීන් සඳහා ද වැඩසටහන් පවත්වන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් ජංගම යෙදවුමක් (App) හඳුන්වා දී ඇත. මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය දායකත්වය ලබාදෙන ලදී. මෙම ජංගම යෙදවුම මගින් පුරවැසියන්ට තොරතුරු ලබාගැනීම පහසු කරන අතර තොරතුරු ඉල්ලුම්පත් කඩිනමින් යොමු කිරීමේ හැකියාවද ලැබේ.

පුරවැසියන්ට තොරතුරු අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධ පරිහරණය කිරීම පහසු කරලීමටත් එමගින් පුරවැසියන්ගේ දැනුවත්භාවය ඉහල නැංවීම සහ තොරතුරු ඉල්ලීම මගින් මහජන අවශ්‍යතා කඩිනමින් සැපයීමත් යන කරුණු පාදක කොට ගනිමින් (info@rti.gov.lk) වෙබ් අඩවිය නිර්මාණය කෙරිණ. තොරතුරු අයිතිවාසිකම් පනත සම්බන්ධව නිල පුවත්පත් පලකිරීම සහ ඉදිරියේදී පැවැත්වීමට නියමිත වැඩසටහන් සම්බන්ධ දැනුවත්කිරීම ද වෙබ් අඩවිය මගින් සිදු කෙරේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධව ක්‍රියාශීලි මෙන්ම ඵලදායී ලෙස පරිශීලනය කල හැකි අයුරින් වෙබ් අඩවිය යාවත්කාලීන කෙරේ.

තොරතුරු අයිතිවාසිකම් පනත සම්බන්ධ වෙබ් අඩවිය දෘෂ්‍යාබාධිත පුද්ගලයන්ට පරිශීලනය කළහැකි අයුරින් සකස් කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් සකස් කර ඇත.

පොදු අධිකාරීන් විසින් දැනුම් දෙනු ලබන තොරතුරු, තොරතුරු නිලධාරීන් හා අභියාචනා නිලධාරීන් පිළිබඳව සකසන ලද දත්ත පාදකය (Database) වෙබ් අඩවියට ඇතුලත් කර ඇති අතර මෙම තොරතුරු දෛනිකව යාවත්කාලීන කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරේ.

නව මාධ්‍ය භාවිතා කර දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීමද ආරම්භ කර ඇත. තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් තොරතුරු පනත පිලිබඳ දැනුවත් කිරීම Facebook පිටුව මගින් ආකර්ශනීය ලෙස සිදු කෙරේ. මීට අමතරව සමාජ මාධ්‍ය ජාලා, විද්‍යුත් තැපෑල සහ You Tube හරහා තොරතුරු පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදුකෙරේ.

පුරවැසියන්ට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධව අධ්‍යයනය කිරීමටත් පර්යේෂණවල නියැලෙන්නන්ට පරිහරණය කිරීමට අවස්ථාව සලසාදීමත් සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධ විමසීම් වලදී සක්‍රීය සේවාවක් සැපයීම සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කොටසක් හඳුනාගෙන ඇත. මෙම සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීමට අදාල උපදේශකත්වය සහ මූල්‍ය දායකත්වය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් ලබාදීමට නියමිතය. මෙම ආයතනය මගින් සම්පත් මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය පොත්පත් කට්ටල, සඟරා, ලිපි ආදිය දැනටමත් ලබාදී ඇත. මීට අමතරව දෛනිකව විධිමත් උපදේශන සේවා සැපයීම ද සිදු කෙරේ.

සැප්තැම්බර් 28 දිනට යෙදෙන ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ දිනය සැමරීම වෙනුවෙන් බණ්ඩාරවෙල නගර ශාලාවේ ජංගම සේවයක් පැවැත්වීම සහ "පවත" පුවත්පත් අතිරේකයේ විශේෂ කලාපයක් නිකුත් කිරීම සිදු කර ඇත. තොරතුරු පනතට සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අංශය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන "පවත" පුවත්පත් අතිරේකය, "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් සමඟ 2020 වසරට අදාළව කලාප 03 ක් ප්‍රකාශයට පත්කර ඇත.

2020 වාර්ෂික අයවැයෙන් රු.මි. 0.623 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් වූ අතර රු.මි. 0.473 ක් වැය කර ඇත. රු.මි. 5.475 ක පුනරාවර්තන ප්‍රතිපාදන වෙන් වූ අතර රු.මි. 1.698 ක් වැය කර ඇත.

iii) *ජනමාධ්‍යවේදීන් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් හඳුන්වා දීම.*

විසි එක්වැනි සියවසට ගැළපෙන සමාජයක් නිර්මාණය කරනු පිණිස භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඉහළින් ම පිළිගන්නා අතර ඒවා රැක ගැනීම පිණිස උපරිමයෙන් ක්‍රියා කෙරේ. ඒ සඳහා ජනමාධ්‍ය ආයතන හා එහි සේවයේ නියුතු වෘත්තියවේදීන්ගේ කාර්යභාරය සඳහා අවශ්‍ය නිවහල් හා නිරවුල් පරිසරය නිර්මාණය කිරීම.

ජනමාධ්‍යවේදීන් සඳහා රක්ෂණාවරණයක් ඇති කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ සාකච්ඡා කරන ලද අතර සංස්ථාව විසින් එක් මාධ්‍යවේදියෙකු සඳහා වර්ෂයකට රු. 20,000 ක වාරිකයකින් ජීවිත, සෞඛ්‍යය හා විශ්‍රාම ආවරණයක් ලබාදීමට රක්ෂණාවරණයක් සකසා ඇත.

iv) *ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සමකාලීන ගෝලීය වර්ධනය සමඟ ශ්‍රී ලාංකේය මාධ්‍ය ක්ෂේත්‍රයට ඇති සබඳතා පිළිබඳ අවබෝධයෙන් යුතුව මාධ්‍ය ප්‍රමිතිකරණය පිළිබඳව ඇති ජාතික හා අන්තර් ජාතික අණපනත්, ජාතික හා අන්තර්ජාතික මාධ්‍ය ආයතනයන්ගේ ක්‍රියාකාරීත්වය සහ සමාජ සංස්කෘතික අනන්‍යතා යන ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානය යොමු කිරීම.*

ජනමාධ්‍ය ප්‍රතිපත්ති සැලසුම්කරණයේ දී ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සංස්කෘතිය, සමාජය, පවුල හා මනුෂ්‍ය සබඳතා පිළිබඳ පිළිගත් සමාජ සංස්කෘතික වටිනාකම් හා සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයනු පිණිස අවබෝධාත්මක ව කටයුතු කිරීම.

v) *අන්තර්ජාතික අණපනත්, ජාතික හා අන්තර්ජාතික මාධ්‍ය ආයතනයන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සලකා බලා ශ්‍රී ලංකාව තුළ රූපවාහිනී හා ගුවන් විදුලි විකාශනයන් සමාජ, සංස්කෘතික අනන්‍යතා යන ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කිරීම සඳහා රූපවාහිනී හා ගුවන්විදුලි බලපත්‍ර විධිමත් කිරීම සඳහා නව විකාශන කොමිෂන් සභාවක් ඇති කිරීමට කටයුතු කිරීම.*

අ) රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීම නියාමනය කිරීම

ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන විෂයන්ට බලපාන මූලික ව්‍යවස්ථාවන් වනුයේ පිළිවෙලින් 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සහ 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතය. යථෝක්ත පනත්වල තිබෙන්නාවූ ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව එම ආයතන විෂයභාර අමාත්‍යවරයාට හිමිවන බලතල ප්‍රකාරව පෞද්ගලික ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන සේවාවන් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබා දීම ද සිදු කළ හැක.

මෙම බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරීමය.

2020 දෙසැම්බර් 31 දිනවන විට ක්‍රියාකාරීව පවතින පෞද්ගලික රූපවාහිනී හා ගුවන් විදුලි බලපත්‍ර සංඛ්‍යාව හා නාලිකා සංඛ්‍යාව

බලපත්‍ර වර්ගීකරණය	බලපත්‍රලාභී පෞද්ගලික ආයතන සංඛ්‍යාව	පෞද්ගලික නාලිකා සංඛ්‍යාව
ගුවන්විදුලි	18	36
භෞමික රූපවාහිනී	15	20
එකතුව	33	56

සේවා සපයන ආයතන

බලපත්‍ර වර්ගීකරණය	බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව
කේබල් රූපවාහිනී	06
චන්ද්‍රිකා රූපවාහිනී	06
අන්තර්ජාල මත පදනම් වූ රූපවාහිනී	02
ජංගම දුරකතන මත පදනම් වූ රූපවාහිනී	01
එකතුව	**15**

තවද රාජ්‍ය ගුවන් විදුලි ආයතන දෙක වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ඔස්සේ ප්‍රාදේශීය සේවාවන් ද ඇතුළුව ගුවන් විදුලි නාලිකා 16 ක් පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය යන ආයතන දෙක ඔස්සේ රූපවාහිනී සේවාවන් 05 ක් පවත්වාගෙන යනු ලැබේ.

ඒ ඒ කාලයන්හි උචිතයැයි හැඟෙන කොන්දේසි වරින් වර රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන බලපත්‍ර ආකෘතියට එක්කිරීම හේතුවෙන් නිකුත් කර ඇති බලපත්‍රයන්හි කොන්දේසි එකිනෙකට වෙනස් වන බැවින් මෙම නිකුත් කළ බලපත්හි ඒකාකාරීත්වයක් නොමැති වීම, එම බලපත්‍රයන්හි කොන්දේසි වර්තමානයට උචිත වන පරිදි සංශෝධනයන් සිදු නොවීම හා බලපත් කොන්දේසි නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම යන ගැටළු සලකා බලා එයට විසඳුමක් ලෙස 2017.10.25 දින පත් කරන ලද ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන ආයතන වෙත නිකුත් කර ඇති බලපත් නියමානුකූල කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය ලබාදුන් කමිටුව විසින් "විකාශන නියාමන කොමිෂන් සභා පනත" දළ කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව ලබා දී ඇති තීරණය අනුව විද්වත් කමිටුවක් හරහා සමාලෝචනය කරන ලදී. මෙහිදී පැන නැගුනු ගැටලුකාරී තත්වයන්ට විසඳුමක් ලෙස " ශ්‍රී ලංකා විකාශන නීතිය" කෙටුම්පත් කරන ලදී.

ආ) ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම

අංක 12/1037/37/019-1 සහ 13.08.2012 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සියලුම ප්‍රවෘත්ති වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි විය යුතුය. ඒ අනුව සෑම ප්‍රවෘත්ති වෙබ් අඩවියක්ම ලියාපදිංචි කිරීම සඳහා රු. 25,000.00 ක් දල වාර්ෂික ලියාපදිංචිය අලුත් කිරීම සඳහා රු. 10,000.00 ක මුදලක් ද අමාත්‍යාංශය වෙත බැර කළ යුතුය. 2020 දෙසැම්බර් 31 දින දක්වා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ප්‍රවෘත්ති වෙබ් අඩවි සංඛ්‍යාව 25 කි. 2020 වසරට අදාළව නව වෙබ් අඩවි 03 ක් ලියාපදිංචි කර ඇති අතර අලුත් කිරීම් 08 ක් සිදු කර ඇත.

ඇ) ආනයනය කරන ලද ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සඳහා බදු අයකිරීම

මෙම අමාත්‍යාංශය මගින් 2016 අංක 11 දරන මුදල් පනත මඟින් පනවා ඇති නියෝගයන්ට අනුව දේශීය ටෙලි නාට්‍ය හා චිත්‍රපට ප්‍රවර්ධනය සඳහා රූපවාහිනී නාලිකා මගින් විකාශනය කරනු ලබන ආනයනික වැඩසටහන් සඳහා බදු අය කෙරේ. මෙම බදු 2017-11-07 දින නිකුත් කරන ලද අංක 2044/21 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව වූ 2017 අංක 1 දරන මුදල් (ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද) නියෝගවල 13 වැනි නියෝගයෙහි විධිවිධානවලට අනුකූලව ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ නිෂ්කාශන සහතිකයක් නොලබා කිසිදු බලපත්‍රලාභී ආයතනයක් විසින් යම් ටෙලි නාට්‍යයක්, චිත්‍රපටියක් හෝ වාණිජ වැඩසටහනක් විකාශය නොකළ යුතුය. ඒ අනුව ආනයනය කර මෙරට විකාශනය කිරීමට අපේක්ෂිත ටෙලි **නාට්‍ය** චිත්‍රපට හා වාණිජ වැඩසටහන්, අමාත්‍යාංශ ලේකම් විසින් පිහිටුවනු ලබන අධීක්ෂණ මණ්ඩලයක් මගින් අධීක්ෂණයට ලක් කෙරේ.

2020 දෙසැම්බර් 31 දින දක්වා ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් 937 ක් සඳහා නිෂ්කාශණ සහතිකපත් නිකුත් කර ඇති අතර අයකර ගනු ලැබූ බදු මුදල රු.මි. 158.527 කි. එය මහාභාණ්ඩාගාර අරමුදලට බැර කරන ලදී. මෙම කාර්යය සඳහා අධීක්ෂණ මණ්ඩල සාමාජිකයන් 29 දෙනෙකු සම්බන්ධ කර ඇති අතර දෛනිකව තිදෙනා බැගින් වන අනු කමිටු වාර 257 ක් මගින් විකාශන අනුමැතීන් ලබා දී ඇත.

vi) *ඉහළ වෘත්තීය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයින් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල රාජ්‍ය අනුග්‍රහය සහිත "ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක්" පිහිටුවීම.*

දැනට බෙහෙවින් ව්‍යාකූලව පවතින ජනමාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ පවතින ගැටලු හඳුනාගෙන ශාස්ත්‍රීය ප්‍රමිතීන් අනුව මෙම අධ්‍යාපන ක්ෂේත්‍රය අභිවර්ධනය කිරීම සඳහා, විද්වත් කමිටුවක නිර්දේශ සඳහා ඉඩප්‍රස්ථා වර්ධනය කිරීම වෙනුවෙන්, ජනමාධ්‍යවේදීන් සඳහා ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය විසින් පවත්වාගෙන යන ලද පාඨමාලා වර්තමානයේ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් පවත්වාගෙන යන බැවින් තව දුරටත් ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව රාජ්‍ය අනුග්‍රහය සහිතව ශ්‍රී ලංකා පදනම් ආයතනයට අනුබද්ධ ජනමාධ්‍ය උසස් අධ්‍යාපන පීඨයක් පිහිටුවීමට තීරණය කර ඇත. ඒ සඳහා විෂය මාලා, පාලන අධිකාරිය හා දේශන කටයුතු සම්බන්ධව සාකච්ඡා කෙරෙමින් පවතී.

vii) වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවීම් සඳහා ඉඩ ප්‍රස්තා වර්ධනය කිරීම -

"ඇසිදිසි" ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන

ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය වැඩිදියුණු කිරීමේ අරමුණු ඇතිව ආරම්භ කරන ලද මෙම වැඩසටහනින් දිවයිනේ පිළිගත් ජනමාධ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු මාධ්‍ය වෘත්තිකයන්ට උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ඇත. 2020 වර්ෂය සඳහා ජනමාධ්‍යවේදීන් ශිෂ්‍යත්වලාභීන් ලෙස තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලෙස රු.මි. 1.411 ක් ලබාදී ඇති අතර එමගින් 2015 සිට 2019 දක්වා වූ ශිෂ්‍යත්වලාභී ජනමාධ්‍යවේදීන් 30 ක් සඳහා රු.මි. 1.374 ක ගෙවීම් සිදුකර ඇත.

viii) *පුවත්පත්, ගුවන් විදුලි සහ රූපවාහිනී මාධ්‍ය ආයතන ආරම්භ කිරීමේ දී එහි මූල්‍ය ආයෝජනයන් පිළිබඳ රජයේ අවධානය යොමු කෙරේ. එම ක්ෂේත්‍රයේ සෘජු විදේශ ආයෝජන රජයේ අධීක්ෂණයට ලක් කරන අතර එය නව නීති රීති මගින් නියාමනය කිරීම.*

රූපවාහිනී හා ගුවන්විදුලි බලපත්‍ර නිකුත් කිරීමේ තාක්ෂණික කමිටුව සඳහා ආරක්ෂක අමාත්‍යාංශ සාමාජිකයෙකු පත්කිරීම හා බලපත්‍ර ඉල්ලුම් කරන ආයතන පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන ලබාගැනීම. තවද මාධ්‍ය ආයතනයන්හි ආයතන සංයුතිය සම්බන්ධව ආරක්ෂක නිෂ්කාශන ලබාගැනීම.

ix) *ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වාණිජ තරඟකාරිත්වයේ පීඩනයෙන් තොරව ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ආදර්ශ ඉදිරිපත් කිරීම සඳහා සරිලනසේ ක්‍රියාකරන ආයතන බවට පත්කර පාර්ලිමේන්තුවට වගකියන කොමිෂන් සභාවක් යටතට පැමිණවීම.*

මෙම ආයතනයන් සෘජු අධීක්ෂණයට ලක් කරමින් ව්‍යාපාරික සැලැසුම් හා පස් අවුරුදු සැලසුම් සකස් කරවීම.

x) *පුවත්පත් මණ්ඩලය ව්‍යූහාත්මක ලෙස ප්‍රතිසංස්කරණය කර විද්‍යුත්, මුද්‍රිත සහ නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන පිළිබඳ විනිශ්චය ආයතනයක් ලෙස ද මාධ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කෙරෙන මධ්‍යස්ථානයක් ලෙස ද ප්‍රතිසංවිධානය කිරීම.*

විද්‍යුත් මුද්‍රිත සහ නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන පිළිබඳ විනිශ්චය ආයතනයක් ලෙසද කටයුතු කිරීම සඳහා පුවත්පත් මණ්ඩල පනත සමාලෝචනය කිරීම හා ඒ සඳහා පුවත්පත් මණ්ඩලය විසින් මහජන කතිකාවතක් ඇති කරමින් පවතී. තවද මාධ්‍යවේදීන්ගේ අදහස් ලබාගැනීමට සම්මන්ත්‍රණ පැවැත්වීමට සැලසුම් කර ඇත.

xi) *ජනමාධ්‍යවේදීන් සඳහා නාගරික නිවාස සංකීර්ණයක් ගොඩනැගීමට කටයුතු කෙරෙන අතර සහන වාහන ණය ක්‍රමයක් හඳුන්වාදීම*

මේ සඳහා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2020.02.12 දින මාධ්‍යවේදීන් දැනුවත් කිරීම හා අදහස් විමසීම සඳහා සාකච්ඡාවක් පැවැත්විය. එම රැස්වීමේ දී තීරණය වූ පරිදි ජනමාධ්‍යවේදීන්ගේ අවශ්‍යතා පිළිබඳව පුවත්පත් හා වෙබ් අඩවිය ඔස්සේ කැඳවන ලද තොරතුරු, දත්ත පද්ධතියක් වෙත ඇතුළත් කරමින් පවතී.

xii) *ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ද ඇතුළුව මාධ්‍යවේදීන්ට පහසුකම් සලසා දීම උදෙසා පුළුල් පහසුකම් සහිතව "ජනමාධ්‍ය ස්ථාගාර" (Press Clubs) ක්‍රමයක් පළාත්බදව පිහිටුවීම.*

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ ප්‍රාදේශීය වශයෙන් පිහිටුවීමට සාකච්ඡා කර ඇත. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු සංකීර්ණයේ ජනමාධ්‍යවේදීන් සඳහා සියළු පහසුකම් සහිත මධ්‍යස්ථානයක් සැකසීමට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු අනුමැතියට 2020.03.05 දින හා සංශෝධිත වාර්තාව 2020.09.08 දින නැවත ඉදිරිපත් කර ඇත.

xiii) *සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ දැනුම, අවබෝධය හා සන්නිවේදන උපක්‍රම සමාජගත කරනු පිණිස අවශ්‍ය පියවර ගැනීම*

ජනතාවගේ මාධ්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානයට කටයුතු කිරීම.

2.1.4 මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාදී ඇති ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2.1.4.1 ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

වසන්තම් ටීවී නාලිකාව මෙරට දමිළ භාෂාව කතා කරන ශ්‍රී ලාංකික ජනතාව වෙත සුපැහැදිලි දසුන් නැරඹීමට හා දේශීය දමිළ වැඩසටහන් නිෂ්පාදනය කර විකාශනය කිරීමට හැකිවන පරිදි වැඩිදියුණු කිරීමේ ද්වීවාර්ෂික ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 304 කි. 2020 වසර තුල මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබුන ද ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි විය. මුල් කාර්තුවෙහි රු.මිලියනයක් ද අවසන් කාර්තුවෙහි රුපියල් මිලියන 50 ක් ද වශයෙන් රුපියල් මිලියන 51 ක අරමුදල් වෙන් වූ අතර වියදම රුපියල් මිලියන 7.3කි.

2.1.4.2 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් මැදිරි නිෂ්පාදන හා ප්‍රවෘත්ති මැදිරියන්හි කාර්ය ගලනයේ ගුණාත්මකභාවය, නම්‍යශීලීත්වය හා පිරිවැය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, බාහිර විකාශනාගාර මෙහෙයුම්වල ගුණාත්මකතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, රූපවාහිනී නාලිකාවල භෞමික විකාශනය වැඩිදියුණු කිරීම, නව මාධ්‍ය භාවිතය ඉහළ නැංවීම හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ප්‍රවර්ධනය සහ රූපවාහිනී විකාශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති මෙම වසර තුළද දියත් කර ඇත. 2020 වර්ෂයට වෙන් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 290.43 ක් වන අතර වියදම රුපියල් මිලියන 234.85 කි.

රූපවාහිනී වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා ජපන් සංස්කෘතික හුවමාරු වැඩසටහන යටතේ ලද ජපන් අධ්‍යාපනික සහ වාර්තාමය වැඩසටහන් 449 ක් ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයන් සඳහා සිංහල සහ දමිල භාෂාවන්ගෙන් හඬකැවීම්/උපශීර්ෂ ගැන්වීම් සිදුකර විකාශනය කෙරේ. ප්‍රතිපාර්ශවීය අරමුදලින් සිදුකිරීමට නියමිතව තිබූ කාර්යයන් නිම කර ඇත.

2.1.4.3 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

යාල් FM සේවය සඳහා මැදිරි සංකීර්ණයක් ස්ථාපිත කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. සම්බන්ධතා මැදිරි හා බහුකාර්ය මැදිරි යාවත්කාලීන කිරීමේ කටයුතු, විකාශනාගාර අලුත්වැඩියා කිරීමේ කටයුතු නිම කර ඇත. 2020 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 152.14 ක් වෙන් වූ අතර වියදම රුපියල් මිලියන 38.09 කි.

2.1.4.4 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

2020 වර්ෂය තුළදී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද මහජන පැමිණිලි 600 න් පැමිණිලි 521ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කර ඇත. ස්විස්ටර්ලන්ත රජයේ ආධාර ඇතිව ගැටුම්වලින් බලපෑමට ලක්වූ සහ ආන්තික ප්‍රජාවන්ට තොරතුරු දැනගැනීමේ සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහජන හමුවීම්, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වා ඇති අතර UNDP ආධාර යටතේ අභියාචනා ක්‍රියාවලියට තොරතුරු තාක්ෂණය යොදා ගැනීමේ (Web-based Tracking System) ව්‍යාපෘතියද, USAID ආධාර යටතේ තොරතුරු පනත යටතේ පොදු අධිකාරීන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණ ව්‍යාපෘතියද අවසන් අදියරේ ඇත. ඒ සඳහා රුපියල් මිලියන 4.165 ක ප්‍රාග්ධන අරමුදල් වෙන් වූ අතර රුපියල් මිලියන 3.0 ක වියදමක් සිදු කර ඇත. COVID – 19 තත්වය හමුවේ සැලසුම් කරන ලද වැඩමුළු පැවැත්වීමට නොහැකි විය.

2.1.4.5 ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

පුවත්පත් ලියාපදිංචිය, පුවත්පත් පැමිණිලි විභාග කිරීම, ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළු පැවැත්වීම, සිසුන් හා ගුරුවරුන් සඳහා වැඩමුළු පැවැත්වීම පුවත්පත් කලාව පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යාමට අමතරව පුවත්පත් කලාව පිළිබඳ නව සහතිකපත්‍ර පාඨමාලාව ආරම්භ කිරීම සිදුකරන ලදී. 2020 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියනයක් වෙන් වූ අතර ප්‍රගතිය 100% කි.

2.2 අභියෝග

2.2.1 අලාභ මත පවත්වාගෙන යනු ලබන මාධ්‍ය ආයතන ලාභ ලබන ආයතන බවට පත් කිරීම

පෞද්ගලික විකාශන නාලිකා / මුද්‍රිත මාධ්‍ය මෙන් නොව සංස්කෘතිය ආරක්ෂා කිරීම මෙන්ම සභ්‍යත්වය ද ආරක්ෂා කරමින් කටයුතු කිරීම රාජ්‍ය මාධ්‍ය ආයතන සතු වගකීමයි. එතෙකුදු වුවද, වර්තමානයේ පවතින තරඟකාරීත්වය සමඟ නාලිකාවක ගුණාත්මකභාවය වෙනුවට අවධිමත් විකාශන වර්ගීකරණයට යටත්ව විකාශන නාලිකා සඳහා දැන්වීම් සැපයීම හේතුවෙන් පුනරාවර්තන වියදම් පියවා ගැනීමට පවා රාජ්‍ය මාධ්‍ය ආයතන විසින් උපයන ආදායම ප්‍රමාණවත් නොවේ. ජාතික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම සහ තරඟකාරිත්වය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම පරස්පර විරෝධී සාධක දෙකකි. මෙම ආයතන පාඩු ලැබීමට ප්‍රධාන සාධකය දරාගත නොහැකි පොදු කාර්ය වියදමයි. මෙම ආයතන අවම වශයෙන් සමබරතාවක් හෝ පවත්වා ගැනීමට ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කෙරේ.

2.2.2 ශ්‍රී ලංකාවේ රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකිත (Digital) තාක්ෂණය හඳුන්වා දීම

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසම (Analoge) තාක්ෂණය වෙනුවට ලෝකයේ බොහෝ රටවල් විසින් නව තාක්ෂණික තත්ත්වයන් යටතේ වැඩිදියුණු කරන ලද ඩිජිටල් තාක්ෂණය රූපවාහිනී ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත. විශේෂයෙන්ම ප්‍රතිසම තාක්ෂණය ඉවත් වෙමින් පැවතීම නිසා එකී තාක්ෂණය මත පවත්නා විකාශන උපකරණ ඉදිරියේදී නඩත්තු කිරීම ගැටළු සහගත වේ. තවද අංකිත තාක්ෂණය හඳුන්වා දීම මගින් නව සංඛ්‍යාත පරාසයන් වඩා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට ඉඩ ලැබෙන අතර ප්‍රතිසම ක්‍රමයට සම්ප්‍රේෂණය කරනු ලබන රූපවාහිනී නාලිකාවන් සඳහා අවශ්‍ය වන සංඛ්‍යාත පරාසයන් තුළින් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ රූපවාහිනී නාලිකා වැඩි සංඛ්‍යාවක් විකාශනය කිරීමට හැකියාව ලැබෙන අතර මෙහෙයුම් පිරිවැය ද විශාල වශයෙන් අඩු වේ.

2.2.3 ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම

වර්තමානයේදී, ආර්ථික, සමාජීය සහ දේශපාලනික භූමිකාවන්හි ඉතාම ශක්තිමත් හා තීරණාත්මක සාධකයක් බවට ජනමාධ්‍ය පත්ව තිබේ. ජනතාව වෙත තොරතුරු සමීප කරලීම පිණිස ජනමාධ්‍ය ධනාත්මක දායකත්වයක් සපයන අතර එමඟින් යහ පාලනය පවත්වාගෙන යාමට සහාය වේ.

ශ්‍රී ලංකාවෙහි ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සහතික කිරීමේදී නිදහස්, ස්වාධීන සහ ජනතා හිතකාමී මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම වැදගත් වේ. මෙකී කර්තව්‍යය උදෙසා, යහ පාලනයත් ප්‍රජාතාන්ත්‍රවාදයත් පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමෙහිලා ජනමාධ්‍යවේදීන්ගේ පාර්ශවයෙන් විශාල දායකත්වයක් අපේක්ෂා කෙරෙන අතර එබැවින්, රට තුල බහුත්ව සහ විවෘත මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා වෘත්තීය වශයෙන් බලගැන්වුනු ජනමාධ්‍යවේදී ප්‍රජාවක් පැවතිය යුතුය. පසුගිය දශක දෙක පුරාම, වෘත්තීය මාධ්‍යවේදීන් ජනිත කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීමේ ප්‍රයත්නය සාර්ථක වී නොමැත.

ජනමාධ්‍ය සමාජයට වගකිවයුතු වන නිසාම, ඉහළම මාධ්‍ය ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කරමින් අදාළ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව වෘත්තීය මාධ්‍යවේදීන් බිහිකිරීම මගින් අත්‍යන්ත මාධ්‍ය භාවිතයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීමේ සමාජ වගකීම ඉටුකරන ජාතික ආයතනයක් පිහිටුවීමට යෝජනා කෙරේ.

නවීන තාක්ෂණයේ දියුණුව හා ගෝලීය ප්‍රවණතා හේතුවෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නිරන්තර වෙනස්කම් සිදු වෙමින් පවතින අතර, එවැනි වෙනස්කම් සිදු කිරීමේදී වෘත්තීය සංවර්ධනය, ධාරිතාව ඉහළ නැංවීම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. ඒ අනුව, යෝජිත මාධ්‍ය ආයතනය පිහිටුවීම අතිශයින් වැදගත් වේ.

2.2.4 අපක්ෂපාතී විකාශන ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම

ගුවන් විදුලි හා දැන්වීම් ප්‍රචාරයේදී විකාශන ශ්‍රේණිගත කිරීම තීරණාත්මක සාධකයක් ලෙස බලපාන්නේ මහා පරිමාණ දැන්වීම් ප්‍රචාරක ආයතන සඳහාය. විකාශන මධ්‍යස්ථානයන්හි වැඩසටහන් පෙළගැස්මේ සිට අන්තර්ගතයන් දක්වා බලපෑමකට ලක් කර ආර්ථික ශක්‍යතාවය අසමානුපාතික ලෙස පාලනය කිරීමේ හැකියාවක් ශ්‍රේණිගත කිරීම් දත්තවලට ඇත. රාජ්‍ය ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා පමණක් ක්‍රියාත්මකව තිබූ අවධියේ ශ්‍රේණිගත කිරීම් සිදු නොවූ අතර විකාශන ක්ෂේත්‍රයේ සීමා ලිහිල් කිරීමෙන් අනතුරුව පෞද්ගලික සමාගම්වලට ඉඩ ප්‍රස්ථාව ලබාදී වසර කිහිපයකට පසුව ශ්‍රේණිගත කිරීම ආරම්භ විය. දැන්වීම්කරුවන් විසින් ශ්‍රේණිගතකිරීම් පුළුල් ලෙස භාවිතා කළද ඇතැම් විකාශන ආයතන මෙම ක්‍රමවේදය පිළිබඳව තෘප්තිමත් නැත. එබැවින් මෙම අමාත්‍යාංශය මඟින් අපක්ෂපාතී ශ්‍රේණිගත කිරීම් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වේ.

2.2.5 විකාශන නියාමන පනත හඳුන්වාදීම

තාක්ෂණික සහ නෛතික ස්ථරයන්හි සිදුවෙමින් පවත්නා වූ වෙනස්කම්, බලපත්‍ර නිකුත් කිරීමේ දී වර්තමානයේ පවතින යාන්ත්‍රණයෙහි පවත්නා අවිධිමත්භාවය, නිකුත් කරන ලද බලපත්‍රයන්හි පවත්නා ගැටළුකාරීභාවය මෙන්ම අතීතයේදී යම් අවස්ථාවන්හිදී මාධ්‍ය වල හැසිරීම පාදක කොට ගනිමින් රාජ්‍ය හෝ පුද්ගලික යන මාධ්‍ය ආයතන දෙපාර්ශවයම හැසිරවීම උදෙසා යම් ස්වාධීන ආයතනයක් පැවතිය යුතු බවට නිරීක්ෂණය විය.

2.3 අනාගත ඉලක්ක

i) මාධ්‍ය නිදහස තහවුරු වන පරිදි වගකීම් හා වගවීම් සහිත මාධ්‍ය සදාචාරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය නියාමනයන් ක්‍රියාත්මක කිරීම.

ii) රටේ සියලු පුරවැසියන්ට තොරතුරු ලබාගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරීම.

iii) මාධ්‍යවේදීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.


iv) මාධ්‍ය සාක්ෂරතාවය ඇති කිරීම.

v) මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම.



ලේකම්

ජනමාධ්‍ය අමාත්‍යාංශය



03 පරිච්ඡේදය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමසත් මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ ᵖ

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2020		සටහන	තත්‍ය 2020 (රු.)	2019 (රු.)	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	**158,527,000**	615,000,272	
-	දේශීය භාණ්ඩ හා සෙවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		**158,527,000**	615,000,272	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		99,280,182	190,255,000	ඒසීඒ-3
-	තැන්පතු		1,633,252	8,670,154	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		8,529,222	8,319,728	ඒසීඒ-5
-	වෙනත් ලැබීම්		1,850,504	3,458,281	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		111,293,160	**210,703,163**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)		**269,820,160**	**825,703,435**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
	වැටුප්, වේතන සහ අනෙකුත්				
	සෙවක ප්‍රතිලාභ	5	132,768,360	72,204,327	
	අනෙකුත් භාණ්ඩ හා සෙවා	6	69,481,924	94,938,853	ඒසීඒ-2(ii)
	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	1,166,553,638	431,030,954	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
-	මුළු පුනරාවර්තන වියදම් (ඇ)		**1,368,803,922**	**598,174,134**	

අයවැය 2020		සටහන	තත්‍ය 2020 (රු.)	2019 (රු.)	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	10	7,539,965	4,217,429	
-	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	8,026,931	3,465,800	
-	ප්‍රාග්ධන මාරු කිරීම්	12	312,548,784	308,623,510	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
-	හැකියා වර්ධනය	14	2,670,606	11,481,319	
-	වෙනත් මූලධන වියදම්	15	48,245192	18,469,586	
-	මුළු මූලධන වියදම් (ඉ)		**379,031,478**	**346,257,644**	
-	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		-	-	
-	තැන්පතු ගෙවීම්		12,038,020	1,159,311	ඒසිඒ-4
-	අත්තිකාරම් ගෙවීම්		25,087,125	10,810,183	ඒසිඒ-5
-	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		1,784,960,545	956,401,272	
-	2020 දෙසැම්බර් 31 දිනට අඟීම ශෙෂ්ය ඌ = (ඇ-උ)		**(1,515,140,385)**	**(130,697,837)**	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2020 (රු.)	2019 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	8,677,962	11,734,358
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	16,557,903	20,462,589
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	4,771,962	2,397,512
මුළු වත්කම්		**30,007,827**	**34,594,459**

	සටහන	2020 (රු.)	2019 (රු.)
		තත්‍ය	
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		16,545,757	10,045,674
දේපළ පිරියත හා උපකරණ සංචිතය		8,677,962	11,734,358
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	**ඒසීඒ-4**	12,146	10,416,915
අග්‍රීම ශේෂය	**ඒසීඒ-3**	4,771,962	2,397,512
මුළු වගකීම්		**30,007,827**	**34,594,459**

පිටු අංක 06 සිට 72 දක්වා ඒසීඒ 1-6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 73 සිට 80 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	**ගණන් දීමේ නිලධාරී**	**ප්‍රධාන ගණකාධිකාරී**
ජගත් පී. විජේවීර	**එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී. සත්කුමාර**	**එස්.ඒ.එන්.ආර්.සුබසිංහ**
ලේකම්	**අතිරේක ලේකම් (පාලන)**	
ජනමාධ්‍ය අමාත්‍යාංශය		

ජගත් පී. විජේවීර
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය
ඇසිදිසි මැදුර, නො. 163, අළුවිහාරගල මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ - 05

එස්.ආර්.ඩබ්ලිව්.එම්.ආර්.පී. සත්කුමාර
අතිරේක ලේකම් (පාලන)
ජනමාධ්‍ය අමාත්‍යාංශය
163, ඇසිදිසි මැදුර,
කිරුළපන මාවත, පොල්හේන්ගොඩ,
කොළඹ 05.

එස්.ඒ.එන්.ආර්. සුබසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
ජනමාධ්‍ය අමාත්‍යාංශය
163, ඇසිදිසි මැදුර,
කිරුළපන මාවත, පොල්හේන්ගොඩ,
කොළඹ 05.

දිනය - 2021. 04.20

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තක්ෂ	
	2020 (රු.)	**2019 (රු.)**
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	22,230,000	400,994,577
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	1,850,504	3,458,281
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		
අග්‍රිම ලැබීම්	112,298,000	190,255,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**136,378,504**	**594,707,858**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	62,435,981	149,658,949
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	482,358	1,213,165
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	10,017,348	160,259
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	13,271,962	401,930,186
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**86,207,649**	**552,962,559**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
ඇ = (අ)– (ආ)	**50,170,855**	**41,745,299**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම	-	-
අත්තිකාරම් අය කර ගැනීම	3,930,086	3,435,521
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**3,930,086**	**3,435,521**

	2020 (රු.)	2019 (රු.)
අඩු කළා - මුදල් වැය කිරීම් :		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්		
ආයෝජන අත්පත් කර ගැනීම්	52,155,045	51,149,399
අත්තිකාරම් ගෙවීම්	1,996,662	3,494,165
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**54,151,707**	**54,643,564**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) + (ඉ)	**(50,221,621)**	**(51,208,043)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)	**(50,767)**	**(9,462,744)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	539,082	8,485,584
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**539,082**	**8,485,584**
අඩු කළා - මුදල් වැය කිරීම් :		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	742,459	747,681
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**742,459**	**747,681**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)= (ඌ)–(එ)	**(203,377)**	**7,737,903**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) – (ඒ)	**(254,144)**	**(1,724,841)**
ජනවාරි **01** දිනට ආරම්භක මුදල් ශේෂය	254,144	1,986,744
දෙසැම්බර් **31** දිනට අවසාන මුදල් ශේෂය	**-**	**261,903**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1) වාර්තාකරන කාල පරිච්ඡේදය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරන කාල පරිච්ඡේදය වේ.

(2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙළ කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

(3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසළකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

(5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(6) මුදල් හා මුදල් සමාන දෑ

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යාවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු., 000

ආදායම් කේතය	ආදායම් කේතයේ විසතීරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1002-13-00	ආනයනික ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වෙළඳ දැන්වීම් සඳහා අයකරන බද්ද	480,000	480,000	158,527	33

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය

රු., 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,400,174	1,391,122	1,368,804	98
ප්‍රාග්ධන	546,293	555,345	379,031	68
එකතුව	1,946,467	1,946,467	1,747,835	89

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු., 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	රාජ්‍ය සෙවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා දීමනා	160	160	160	100
02.	වෙළඳ අමාත්‍යාංශය	අමාත්‍ය කාර්යාලයේ වියදම් පියවීම	9,194	9,194	9,194	100
03.	රජයේ ප්‍රවෘත්ති	සැලසිනේ	367	367	367	100

	දෙපාර්තමේන්තුව	ආයතනයේ වියදම් පියවීම				
04.	මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කාර්ය මණ්ඩල ගෙවීම් පුනිපුර්ණය සඳහා	296	296	296	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විසත්රය	**2020.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශෙෂ්ය	**2020.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශෙෂ්ය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	
9152	යන්ත්රෝපකරණ	-	8,678	-	
9153	ඉඩම්	-	-	-	
9154	අසප්ෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } එම්ඊඩී/ඒ/එම්එම්/2020/05

මෙම අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021



ලේකම්,
ජනමාධ්‍ය අමාත්‍යාංශය.

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව සැප්තැම්බර් 14 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරවඅමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය සතුව වාහන 28 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර එම වාහනවල වටිනාකම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබූ බැවින්, දේපල පිරියත හා උපකරණවල වටිනාකම් නිවැරදි නොවුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 2020 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය

2020 අගෝස්තු 08 දින අතිගරු ජනාධිපතිතුමා විසින් අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසු ශීර්ෂ 105 ජනමාධ්‍ය අමාත්‍යාංශය ආරම්භ විය. 2020 ජනවාරි මාසයේ සිට 2020 අගෝස්තු 31 දින දක්වා එවකට පැවැති ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හා අමාත්‍යාංශ 03 ක වැය විෂයයන් 73 ක් යටතේ වැය කර තිබුණු එකතුව රු.මිලියන 805 ක වියදම් මෙම අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පුනරාවර්තන වැය විෂයයන් 07 ක රු.1,237,496ක් හා මූලධන වැය විෂයයන් 10ක රු.115,959,168ක් වශයෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවති අතර මෙය එම වැය විෂයයන් සඳහා වූ ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය නොකිරීම හෝ ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා මත සිදුවූවක් බව නිරීක්ෂණය විය.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂය තුළ නිරවුල් කළ රු.217,669 ක් වූ බැඳීම් හා බැරකම් 02 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2020 වර්ෂයේදී 105-01-03-1409 වැය විෂයයේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට බැරකමක් ලෙස තිබූ රු.659,610ක් 2021 පෙබරවාරි 02 දින ගෙවා තිබූ අතර, එය 2021 වර්ෂයේ වැය ලෙජරයේ පෙර වර්ෂයේ ගිණුම්ගත බැඳීම් ලෙස නොදක්වා 2021 වර්ෂයේ ගිණුම්ගත බැඳීම් ලෙස සටහන් කර තිබුණි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
2015 ජූලි 14 දිනැති අංක 3/2015 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ	තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත් දින 18 සිට දින 116ක් දක්වා ප්‍රමාද වී පියවීම් සිදුකර තිබූ අවස්ථා 26ක් නිරීක්ෂණය විය.

2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාගත් අත්තිකාරම් නිසි පරිදි පියවීමට අපොහොසත් වීම නිසා නිලධාරීන් තුන්දෙනෙකුට අත්තිකාරම් ලබා දීමෙන් වලකින ලෙස ප්‍රධාන ගණකාධිකාරී විසින් දැනුම් දී තිබුණ ද ඊට පටහැනිව රු. 258,950 අත්තිකාරම් අවස්ථා 14කදී ලබාදී තිබුණි.

(ආ) එක් අත්තිකාරමක් ලබාදී එය පියවීමට ප්‍රථම නිලධාරීන් 4දෙනෙකුට අවස්ථා 20 කදී රු.335,408ක අත්තිකාරම් ලබාදී තිබුණි.

2.7 අත්තිකාරම් ගිණුම් ශේෂ

2020 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.231,188 ක ශේෂයක් පැවති අතර ඊට අදාළ කාල විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. එම හිඟ ණය ශේෂය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් 2021 මාර්තු 31 දින වන විටත් අනුගමනය කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

2020 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ 02කට අදාලව වියදම රු.මිලියන 9.235ක්වූ ක්‍රියාකාරකම් 03ක කාර්යසාධන ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් සිය ප්‍රසම්පාදන සැලැස්ම ඒ අනුව යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) අනුව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරනතුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළයුතු වුවද අමාත්‍යාංශය විසින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

අමාත්‍යාංශයේ භාවිතයේ තිබූ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් PD-9625 දරන කැබරථය 2016 දෙසැම්බර් 26 දින අනතුරකට ලක්වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනතුර සිදුවන අවස්ථාව වන විට වාහනයට අනුයුක්ත කර ඇති රියදුරු වෙනුවට එවකට සිටි අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා රියදුරු ලෙස කටයුතු කර තිබුණ ද, වාහනයක් පැදවීම සඳහා අවශ්‍ය රියදුරු බලපත්‍රයක් ඔහු සතුව නොතිබුණු බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් 2019 ජූනි 27 දින ලබාදුන් ලිපිය අනුව නිරීක්ෂණය විය.

(ආ) මු.රෙ. 104 (1) පරිදි පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය කිරීමටත් ඊට වගකිවයුත්තන් නිශ්චය කිරීමටත් පරීක්ෂණ ආරම්භ කළයුතු වුවත් ආයතනය විසින් අනතුර සිදුවී වසර 1 1/2කට පමණ පසුව පරීක්ෂණය පැවැත්වීම සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කර තිබුණු අතර එම මූලික පරීක්ෂණය සිදුකර වාර්තාව ලබාදීමට වසර දෙකකට වැඩි කාලයක් ගතවී තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

2020 වර්ෂයේදී අනුමත සේවක සංඛ්‍යාව 158 ක් වී තිබුණු අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 105 ක් වීම නිසා පුරප්පාඩු 53 ක් පැවැතුණි. එම පුරප්පාඩු පිරවීම සඳහා වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(කේ.කේ.වී ධර්මසිරි)
අතිරේක විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිතවූ දර්ශක	තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස			
		100% - 90%	**75% - 89%**	**50% - 74%**	**0% - 49%**
1	විකාශන නීතිය කෙටුම්පත් කිරීම	100%	-	-	
2	තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා ජනතාව දැනුම්වත් කිරීම	-	-	-	10%
3	වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම				
3.1	ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන	100%	-	-	-
3.2	මාධ්‍යවේදීන් සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම	-	-	-	15%
4	මාධ්‍යවේදීන් සඳහා පහසුකම් සැලසීම				
4.1	නාගරික නිවාස සංකීර්ණයක් ඉදි කිරීම	-	-	-	5%
4.2	රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම	-	-	-	10%

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගකීම් සහගත මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම සඳහා පහසුකම් සලසන අතරතුර මාධ්‍ය ක්‍රියාකාරීත්වයෙහි විශිෂ්ටත්වය කරා ප්‍රවිශ්ට වීම.

අරමුණු/ පරමාර්ථය	ඉලක්කය (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75%- 100%
4.ගුණාත්මක අධ්‍යාපනය	4.4 2030 වන විට රැකියා, සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා අවැසි තාක්ෂණික සහ වෘත්තීය නිපුනතා ද ඇතුලු අදාල නිපුනතා සහිත තරුණ සහ වැඩිහිටි ජනගහනය ක්‍රමිකව වැඩි කිරීම	ජාතික මාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනය	10%		
		ඇසි දිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන			100%
16.සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන	16.10 ජාතික නීතිය සහ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව තොරතුරු වලට මහජනතාවට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කොට මූලික නිදහස තහවුරු කරලීම.	තොරතුරු නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	10%		
		මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්			80%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ :

i. වෘත්තීය ජනමාධ්‍යවේදීන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට බිහි කිරීමේ අරමුණින් ජාතික ජනමාධ්‍ය ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව මෙම අමාත්‍යාංශය මඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර එම දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය වශයෙන් මෙම ව්‍යාපෘති සංකල්පයට එකඟතාවය පල කර ඇත. 2020.08.09 දින අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව තෘතීයික අධ්‍යාපන ආයතනයක් වන ශ්‍රී ලංකා පදනම් ආයතනය මෙම අමාත්‍යාංශයීය විෂය පථය යටතට පත් කිරීමත් සමගම එම ආයතනය සමඟ ඒකාබද්ධව ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනය පිහිටුවීමට කටයුතු කෙරේ.

ii. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කර එය සමාජගත කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය විසින් දරනු ලැබූ අතර තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව හරහා අභියාචනා විභාග කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

අභියෝග :

i. සමස්ත රාජ්‍ය ප්‍රවේශය සඳහා රාජ්‍ය ආයතන අතර සුසංයෝගයක් ඇති කර ගැනීම හරහා සාමූහික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා ඒකාබද්ධ සැලසුම්කරණයකට ප්‍රවිෂ්ඨ වීම.

ii. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අදාල කරගන්නා නියාමනයන් කිරීමට ශක්තිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම.

iii. රාජ්‍ය මාධ්‍ය ආයතන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම.

iv. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලික මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය කාර්යක්ෂමව යොදා ගැනීම.

v. රාජ්‍ය මාධ්‍ය ආයතන ලාභ ඉපැයීමම අරමුණු කර කටයුතු නොකරන බැවින් තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	25	15	10	00
තෘතීයික	06	03	03	00
ද්විතියික	89	58	31	00
ප්‍රාථමික	38	29	09	00
එකතුව	**158**	**105**	**53**	**00**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

කාර්ය මණ්ඩලයේ 53 දෙනෙකුගේ හිඟයක් පවතී. ශ්‍රම බලකායට හිඟයක් ඇති විට, සෑම සේවකයෙකුටම පැවරෙන අතිරේක රාජකාරි කටයුතු ප්‍රමාණය නිසි වේලාවට අවසන් කිරීම සඳහා මානසික ආතතියකින් සහ තෘප්තිමත්භාවයකින් තොරව කටයුතු කිරීමට සිදුවේ. එය කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය පහළ හෙලන අතරම සමස්තයක් ලෙස ආයතනයේ කාර්ය සාධනය අවම කරයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය	වැඩසටහන් කාලය	මුළු ආයෝජනය (රු.)		වැඩසටහනෙහි ස්වභාවය (විදේශීය / දේශීය)	සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම
			දේශීය	විදේශීය		
Higher National Diploma in Public Procurement and Contract Administration	01	වසර 1	120,000	-	දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් නිපුණතාවය වැඩි දියුණු කිරීම
කාර්යාල ක්‍රමවේද හා ආචාරධර්ම පිළිබඳ වැඩමුළුව	03	දින 2	25,500	-	දේශීය	කාර්යාලීය ක්‍රම සහ ආචාරධර්ම අනුගමනය කිරීමෙන් කාර්යාලීය කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකර ගැනීමට හැකියාව ලබා ගැනීම.
ලංසු කැඳවීමේ ලේඛන පිළියෙල කිරීම (භාණ්ඩ හා සේවා)	01	දින 2	8,500	-	දේශීය	ජාතික තරඟකාරී හා මිල සැදහුම් ක්‍රමය (Shopping method) යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන විට ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයට අනුව ලංසු ලේඛන පිලියෙල කිරීම මගින් වඩාත් ඵලදායි ලෙස භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට හැකියාව ලබා ගැනීම
Workshop on Public Procurement Procedures	01	දින 2	8,500	-	දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් නිපුණතාවය වැඩි දියුණු කිරීම
අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම	01	දින 1	8,500	-	දේශීය	අමාත්‍ය මණ්ඩල සංදේශ නිවරදිව හා ඵලදායි ලෙස ඉදිරිපත් කිරීම.

වැඩසටහනෙහි නම	පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය	වැඩසටහන් කාලය	මුළු ආයෝජනය (රු.)		වැඩසටහනෙහි ස්වභාවය (විදේශීය / දේශීය)	සාක්ෂාත් කරගත් ප්‍රතිඵල/දැනුම
			දේශීය	විදේශීය		
Fire & Emergency Response Training	50	දින 1	60,000	-	දේශීය	හදිසි ආපදා අවස්ථාවක ජීවිත හා දේපල ආරක්ෂා කර ගැනීමේ ක්‍රමවේද, ප්‍රථමාධාර පිළිබඳ දැනුම හා හැකියාව ලබා ගැනීම
Master in Public Administration & Management	01	වසර 1	75,000	-	දේශීය	රාජ්‍ය පරිපාලනය සඳහා අවශ්‍ය පරිපාලන හා කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
Master in Information System Management	01	වසර 1	62,500	-	දේශීය	තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
Certificate Course in Journalism	01	මාස 6	18,000	-	දේශීය	ජනමාධ්‍ය පිළිබඳ දැනුම ලබා ගැනීම
Digital Marketing Essential Qualification	01	මාස 6	45,000	-	දේශීය	ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
එකතුව	**61**		**431,500**			

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීමේ අරමුණ නම් කාර්යාලීය වැඩකටයුතු නිසි අයුරින්, ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමට ඔවුන් පොළඹවා ගැනීමයි. පුහුණු පාඨමාලා, නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරන අතර ඔවුන්ගේ හැකියා වර්ධනය වැඩිදියුණු කිරීමටද ඉවහල් වේ. මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා සේවාස්ථ පුහුණු පාඨමාලාවක් හඳුන්වා දුන් අතර මේ සඳහා රජයේ පිළිගත් ආයතනයක සම්පත්දායකයින්ගේ දායකත්වය ලබා ගන්නා ලදී.

රාජ්‍ය අංශයට නවක පත්වීම් ලද අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද නිලධාරීන් අනිවාර්ය පුහුණු පාඨමාලාවලටද යොමු කරන අතර මෙමගින් ඔවුන් රැකියාවට වඩා හොඳින් අනුගත වේ.

තවද මෙම පුහුණු පාඨමාලා තුළින් නිලධාරීන්ට රාජකාරී පරිසරයේ ඒකාකාරී බවින් මිදීමට හා නව දැනුමින් සන්නද්ධ වීමට අවස්ථාව ලැබේ.

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීම තුළින් අමාත්‍යාංශයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකියාව ලැබේ.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	**2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම**	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-

4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			

7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	DMA/AMC/M/2020/5-4 හා 2020/06/11 දිනැති විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් 2020 සඳහා තෙවන හා සිව්වන කාර්තු සඳහා පමණක් කමිටු පැවැත්විය යුතු බව දන්වා ඇත.	2020/09/10 දින තෙවන කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලදී. සිව්වන කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පෙබරවාරි මාසයේ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාළ නොවේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන	අනුකූල වේ	-	-

	ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
14	**අග්‍රීම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රීම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		-
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රීම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-

16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල නොවේ	දැනට කියාත්මක නොවේ. ඉදිරි වර්ෂ සඳහා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරි වර්ෂ සඳහා සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.	

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	ඉදිරි වර්ෂ සඳහා සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරි වර්ෂ සඳහා විධිමත් පරිදි පුහුණු අවස්ථාවන් සැලැස්ම තුළ ඇතුලත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	ඉදිරි වර්ෂ සඳහා ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කරනු ලැබේ	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	-



ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministry of Mass Media

අංක.163, ඇසිඩිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05
இல. 163, அசிதிசி மெதுர, கிருலப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05
No. 163, Asi Disi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05

www.media.gov.lk

Department of Government Printing